# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2026.04.04 පැය 1720 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 558 /2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු.</u>

**பொலிஸ் ஊடகப் பிரிவிற்கு அறிவிக்கப்பட்ட முக்கிய தகவல்கள்:**

**Important Information Reported to the Police Media Division**

**01. මනුෂ්‍ය ඝාතනයකට අවශ්‍යකර සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - ගම්පහ පොලිස් වසම.**

2026.03.31 වන දින දහවල් ගම්පහ පොලිස් වසමේ මාකවිට ප්‍රදේශයේ නිවසක් තුල කාන්තාවක් සැකකටයුතු ලෙස මිය යෑමේ සිද්ධිය සම්බන්ධයෙන් ගම්පහ පොලිසිය මඟින් විමර්ශන ආරම්භ කර තිබුණි.

පවුල් ආරවුලක් හේතුවෙන් මරණකාරියගේ ස්වාමි පුරුෂයා විසින් ඇගේ ගෙල සිරකර මෙම ඝාතනය සිදුකර ඇති බවට සිදු කරන ලද විමර්ශන වලදී අනාවරණය වී ඇත. ඝාතනය සම්බන්ධයෙන් වයස අවුරුදු 76 ක් වූ සැකකරු 2026.04.03 වන දින අත්අඩංගුවට ගෙන ඇත. ගම්පහ පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

***மனிதக் கொலைக்காக தேடப்பட்ட சந்தேகநபர் கைது – கம்பஹா பொலிஸ் பிரிவு***

*2026.03.31 அன்று மதியம் கம்பஹா பொலிஸ் பிரிவிற்குட்பட்ட மாகவிட்ட பகுதியில் உள்ள வீட்டில் ஒரு பெண் சந்தேகத்திற்கிடமான முறையில் உயிரிழந்த சம்பவம் தொடர்பாக கம்பஹா பொலிஸார் விசாரணைகளை ஆரம்பித்திருந்தனர்.*

*குடும்ப தகராறு காரணமாக, உயிரிழந்த பெண்ணின் கணவர் அவரை கழுத்து நெரித்து கொலை செய்தது விசாரணைகளில் தெரியவந்துள்ளது. சம்பவத்துடன் தொடர்புடைய 76 வயதுடைய சந்தேகநபர் 2026.04.03 அன்று கைது செய்யப்பட்டுள்ளார். மேலதிக விசாரணைகள் கம்பஹா பொலிஸாரால் மேற்கொள்ளப்படுகின்றன.*

**Suspect Wanted for Murder Apprehended – Gampaha Police Division**

The Gampaha Police initiated investigations into the suspicious death of a woman at a residence in the Makawita area within the Gampaha Police Division on the afternoon of 31.03.2026.

Subsequent inquiries have revealed that the victim was allegedly strangled to death by her husband following a domestic dispute. The 76-year-old suspect connected to the murder was apprehended on 03.04.2026. Further investigations are being conducted by the Gampaha Police.

## 02. ලොරි රථයක ගැටී පදිකයෙකු ජීවිතක්ෂයට - කටුනායක පොලිස් වසම.

2026.04.04 වන දින අළුයම කටුනායක පොලිස් වසමේ කොළඹ පුත්තලම මාර්ගයේ 18 කණුව ආසන්නයේදී පුත්තලම දෙසට ධාවනය වූ ලොරි රථයක පදිකයෙකු ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදිකයා මීගමුව රෝහලට ඇතුළත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරුගේ අනන්‍යතාව මෙතෙක් තහවුරුවී නොමැති** අතර අනතුරින් පසු ලොරි රථය නොනවත්වා පලාගොස් ඇත. ලොරි රථයේ රියැදුරු අත්අඩංගුවට ගැනීම සඳහා කටුනායක පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### *லாரி மோதி பாதசாரி உயிரிழப்பு – கட்டுநாயக்க பொலிஸ் பிரிவு*

*2026.04.04 அன்று அதிகாலை கட்டுநாயக்க பொலிஸ் பிரிவிற்குட்பட்ட கொழும்பு-புத்தளம் வீதியின் 18ஆம் கம்பம் அருகே புத்தளம் நோக்கி சென்ற லாரி ஒன்றுபாதசாரியை மோதியதால் விபத்து ஏற்பட்டுள்ளது.*

*விபத்தில் படுகாயமடைந்த அவர் நீர்க்கொழும்பு மருத்துவமனைக்கு அனுமதிக்கப்பட்ட பின்னர் உயிரிழந்துள்ளார்.*

*உயிரிழந்தவரின் அடையாளம் இதுவரை உறுதிசெய்யப்படவில்லை. விபத்திற்குப் பின்னர் லாரி நின்றுவிடாமல் தப்பிச் சென்றுள்ளது. லாரி ஓட்டுநரை கைது செய்ய கட்டுநாயக்க பொலிஸார் மேலதிக விசாரணைகளை மேற்கொண்டு வருகின்றனர்.*

### Pedestrian Fatally Struck by Lorry – Katunayake Police Division

On the morning of 04.04.2026, a pedestrian was struck by a lorry travelling towards Puttalam. The victim, who sustained critical injuries, succumbed after being admitted to the Negombo Hospital.

The identity of the deceased has not yet been established. The lorry fled the scene without stopping following the incident. Katunayake Police are conducting further investigations to locate and apprehend the Driver of the lorry.

## 03. ලෝඩර් රථයක ගැටී යතුරුපැදිකරුවෙකු හා පසුපැදිකරුවෙකු ජීවිතක්ෂයට - ධර්මපුරම් පොලිස් වසම.

2026.04.03 වන දින රාත්‍රී ධර්මපුරම් පොලිස් වසමේදී මුලතිව් දෙස සිට පරන්තන් දෙසට ධාවනය වූ ලෝඩර් රථයක එම රථයට පිටුපසින් පැමිණි

යතුරුපැදියක් ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ පැදිකරු හා පසුපැදිකරු ධර්මපුරම් රෝහලට ඇතුළත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරුවන් අවුරුදු 20 වයසේ පසු වූ ධර්මපුරම් ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

අනතුරින් පසු ලෝඩර් රථයේ රියැදුරු අත්අඩංගුවට ගෙන ලෝඩර් රථය පොලිසියට ඉදිරිපත් කර ඇත. ධර්මපුරම් පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

***லோடர் வாகனம் மோதி மோட்டார் சைக்கிளில் சென்ற இருவர் உயிரிழப்பு – தர்மபுரம் பொலிஸ் பிரிவு***

*2026.04.03 அன்று இரவு தர்மபுரம் பொலிஸ் பிரிவில், முல்லைத்தீவு நோக்கி வந்த லோடர் வாகனத்துடன் அதற்குப் பின்னால் வந்த மோட்டார் சைக்கிள் மோதியதில் விபத்து ஏற்பட்டுள்ளது.*

*இந்த விபத்தில் காயமடைந்த ஓட்டுநரும் பின்னால் சென்றவரும் தர்மபுரம் மருத்துவமனைக்கு அனுமதிக்கப்பட்ட பின்னர் உயிரிழந்துள்ளனர்.*

*உயிரிழந்தவர்கள் 20 வயதுடைய தர்மபுரம் பகுதியைச் சேர்ந்தவர்கள் ஆவர்.*

*விபத்திற்குப் பின்னர் லோடர் வாகன ஓட்டுநர் கைது செய்யப்பட்டு வாகனம் பொலிஸாரிடம் ஒப்படைக்கப்பட்டுள்ளது. மேலதிக விசாரணைகள் தர்மபுரம் பொலிஸாரால் மேற்கொள்ளப்படுகின்றன.*

**Motorcyclist and Pillion Rider Killed in Collision with Loader – Dharmapuram Police Division**

On the night of 03.04.2026, a motorcycle travelling in the same direction collided with a loader vehicle heading towards Paranthan from Mullaitivu within the Dharmapuram Police Division.

Both the rider and the pillion passenger, who sustained severe injuries, later died after being admitted to the Dharmapuram Hospital. The deceased were residents of the Dharmapuram area and were in their twenties.

Following the incident, the driver of the loader vehicle was arrested, and the vehicle was taken into police custody. Further investigations are being carried out by the Dharmapuram Police.

**04. යතුරුපැදියක් බස් රථයක ගැටී පසුපැදිකාරිය ජීවිතක්ෂයට - කිරිඇල්ල පොලිස් වසම.**

2026.04.03 වන දින සවස කිරිඇල්ල පොලිස් වසමේ කුරුගම්මෝදර ප්‍රදේශයේදී රත්නපුර දෙස සිට පානදුර දෙසට ධාවනය වූ යතුරුපැදියක් එයට විරුද්ධ දෙසින් පැමිණි පුද්ගලික බස් රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින්

පැදිකරු හා පසුපැදිකාරිය බරපතල තුවාල ලබා රත්නපුර රෝහලට ඇතුලත් කර ඇති අතර ප්‍රතිකාර ලබමින් සිටියදී පසු පැදිකාරිය මිය ගොස් ඇත.

මරණකාරිය වයස අවුරුදු 39 ක් වූ අයගම ප්‍රදේශයේ පදිංචිකාරියකි.

අනතුරට අදාල බස් රථයේ රියැදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර කිරිඇල්ල පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**

## மோட்டார் சைக்கிள் – பேருந்து மோதல்: பெண் உயிரிழப்பு – கிரியெல்ல பொலிஸ் பிரிவு

*2026.04.03 அன்று மாலை கிரியெல்ல பொலிஸ் பிரிவிற்குட்பட்ட குருகம்மோடர பகுதியில், இரத்தினபுரி நோக்கி வந்த மோட்டார் சைக்கிள் எதிர்திசையில் வந்த தனியார் பேருந்துடன் மோதியதில் விபத்து ஏற்பட்டுள்ளது.*

*இந்த விபத்தில் மோட்டார் சைக்கிள் ஓட்டுநரும் பின்னால் சென்ற பெண்ணும் கடுமையாக காயமடைந்து ரத்தினபுரம் மருத்துவமனைக்கு அனுமதிக்கப்பட்டனர். சிகிச்சை பெற்று வந்தபோது பின்னால் சென்ற பெண் உயிரிழந்துள்ளார்.*

*உயிரிழந்தவர் 39 வயதுடைய அயகம பகுதியைச் சேர்ந்தவர் ஆவார்.*

*விபத்தில் தொடர்புடைய பேருந்து ஓட்டுநர் கைது செய்யப்பட்டுள்ளார். மேலதிக விசாரணைகள் கிரியெல்ல பொலிஸாரால் மேற்கொள்ளப்படுகின்றன.*

***பொலிஸ் ஊடகப் பிரிவு.***

## Passenger Killed in Motorcycle – Bus Collision – Kiriella Police Division

On the evening of 03.04.2026, a motorcycle travelling from Ratnapura towards Panadura collided with a privately owned bus travelling in the opposite direction in the Kurugammodara area within the Kiriella Police Division.

Both the rider and the passenger sustained serious injuries and were admitted to the Ratnapura Hospital. The passenger later succumbed to injuries while receiving treatment.

The deceased has been identified as a 39-year-old resident of the Ayagama area. The driver of the bus involved in the accident has been apprehended, and further investigations are ongoing by the Kiriella Police.

**Police Media Division**